නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය - 2020

## සිංහල භාෂාව

## 7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**(3) ඒකකය**

## <u>අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය</u>

**(1) පහත සඳහන් පාඨයේ යෙදී ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන ලියන්න.**

'' ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මේ ශ්‍රී ලංකාද්වීපයෙහි සතුරු ගනඳුරු බිඳ හැර ධවල ඡත්‍ර නැංවූ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ වට්ටගාමිණී අභය මහ රජුගේ රාජ්‍ය සමයේ මාතලේ අලු ලෙනේ දී මහා සංඝ රත්නය විසින් ත්‍රිපිටක ධර්ම සංගායනාවක් පවත්වා අඛණ්ඩව සුරක්ෂා කර ගැනීම සඳහා ග්‍රන්ථාරූඪ කර තැනීම ශාසන ඉතිහාසයේ වඩාත් ප්‍රතිඵල දායක වූ සංසිද්ධියකි. ''

……………………………………………………………………………………..

……………………………………………………………………………………..

……………………………………………………………………………………..

**02. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) අපේ පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද ?

……………………………………………………………………………………..

(ii) එහි එන අක්ෂර මාලාවේ අකුරු ගණන කීයද ?

……………………………………………………………………………………..

(iii) මහාප්‍රාණ අකුරු හා ශ, ෂ, ෂ අකුරු ඇතුළත් හෝඩිය හඳුන්වන්නේ කවර නමකින් ද?

……………………………………………………………………………………..

(iv) එම අක්ෂර ගණන කීයද ?

……………………………………………………………………………………..

(v) ක, ච, ට, ත, ප, ග, ජ, ඩ, ද, බ මෙම අකුරු අල්පප්‍රාණ ලෙස නම් කිරිමට හේතුව කුමක් ද ?

……………………………………………………………………………………..

(3) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

(i) විශ්මය , විෂ්මය , විස්මය

(ii) නිශ්ශබ්ද , නිස්ශබ්ද , නිෂ්ශබ්ද

(iii) විශේෂණ , විෂේශණ , විසේසන

(iv) ප්‍රස්තාර , ප්‍රශ්තාර , ප්‍රස්තාර

(v) ආශ්වාද , ආෂ්වාද , ආස්වාද

(4) පහත දැක්වෙන ඡේදවල අක්ෂර වින්‍යාස දෝෂ සහිත ස්ථාන නිවාරදි කර ලියන්න.

(i) කඩපොලට ගිය තාත්තා එනතුරු මම කඩුල්ල ලඟ බලා සිටියෙමි. ඒ ඔහු මට ටොපී දෙකක් රැගෙණ එනු ඇතැයි යන විශ්වාසයෙනි. අඳුර ගලා එද්දී ඈත අහසේ හද පායා එනු පෙනුණි.

(ii) භාශාවේ විෂේශත්වයක් වන්නේ ලේඛණයට හා කතනයට බාවිත කල හැකිවීමයි. සිංහල බාෂාව සැලකූ විට එහි කතන ස්වරූඑයේ ලේඛණ ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙණේ.